# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා අපේක්ෂිත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නුපුහුණු තනතුරු

### 01). ගස් කපන්නා (III ශ්‍රේණිය) - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පුරප්පාඩු ගණන - 02

වැටුප් පරිමාණය - රු: 42775-16x450 -49975 (U-PL 1)

සුදුසුකම් :

01 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සම්මාන 2ක් සහිතව සමත්විය යුතුය.

02 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

03 රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

04 මනා චරිතයකින් හෙබි විය යුතුය.

05 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

### 2). සෞඛ්‍ය සේවා කම්කරු (III ශ්‍රේණිය) - මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල උප ඒකකය
පුරප්පාඩු ගණන - 01

වැටුප් පරිමාණය – රු: 42775-16x450-49975 (U-PL 1)

සුදුසුකම් :

01 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිය යුතුය.

02 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

03 රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

04 මනා චරිතයකින් හෙබි විය යුතුය.

05 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**3). වැඩ සහයක (III ශ්‍රේණිය) - විශ්වවිද්‍යාල කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය දොඩම්ගොල්ල - කුණ්ඩසාලේ**
පුරප්පාඩු ගණන - 08

වැටුප් පරිමාණය - රු: 42775-16x450 -49975 (U-PL 1)

සුදුසුකම් :

I. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 ක් සම්මාන 2ක් සහිතව සමත්විය යුතුය.

II. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

III. රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

IV. මනා චරිතයකින් හෙබි විය යුතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

අර්ධ පුහුණු තනතුරු

**04). බංගලා භාරකරු /අරක්කැමි 111 ශ්‍රේණිය තනතුර - පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
පුරප්පාඩු ගණන - 01

වැටුප් පරිමාණය :රු 44,575 – 16 x 490- 52,415 [U-PL 2(III)]

සුදුසුකම් :

01. අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම හා තනතුරට ආදාලව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (N.V.Q) 2හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

හෝ

02. අ.පො.ස (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබිය යුතු අතර කාර්මික නිපුණතා සහිතව අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද තිබිය යුතුය.

අනෙකුත්,

03. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

04. රාජකාරි නිසිලෙස ඉටුකිරීමට හා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව සුදුසු විය යුතුය.

05. මනා චරිතයකින් හෙබි විය යුතුය.

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

සටහන:

(අ). මෙම පුරප්පාඩු ප්‍රායෝගික පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය පදනම් කරගෙන පුරවනු ලැබේ. මේ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය විශ්වවිද්‍යාලය සතුය.

(ආ) ඉහත සඳහන් වැටුපට අමතරව, රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත දීමනාද ගෙවනු ලැබේ.

(ඇ). රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ. කෙසේ වුවද එබඳු අයදුම්කරුවන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ සමඟ සහතික කරන ලද වර්තමාන වැටුප් විස්තරද එවිය යුතුය.

(ඇ). තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයට ද දායක වනු ඇත. ඒ අනුව සේවකයාගේ වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන අතර, එම වැටුපෙන් 7% කට හා 8% කට සමාන වන කොටස් සේව්‍යයා විසින් පිළිවෙලින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. මීට අමතරව සේව්‍යයා විසින් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

(ඉ) අයදුම්පත් http://www.pdn.ac.lk/vacancies/ යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර නිසි පරිදි සම්පූරණ කරන ලද අයදුම්පත සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල ඡායා පිටපත් සමඟ 2026.06.30 දින හෝ එදිනට පෙර ලැබෙන සේ <u>**“නියෝජ්‍ය ලේඛකාධිකාරි, අනධ්‍යයන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය”**</u> යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර පෞද්ගලිකව භාරදෙන අයදුම්පත් සම්බන්ධව වග කියනු නොලැබේ. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඊ) තමන් විසින් අයදුම්කරනු ලබන තනතුරෙහි නම අයදුම්පත්‍රයේ පැහැදිලිව සඳහන් කර එවිය යුතුවේ. එසේම තනතුරෙහි නම අයදුම්පත්‍රය එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර එවිය යුතුවේ.

වැඩබලන ලේඛකාධිකාරි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය